සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**අවසත් පෙරහුරු පරීක්ෂණය (2022-2023)**

බුද්ධ ධර්මය                                        කාලය පැය තුනයි

# 1 කොටස

ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

1 ආර්ය මාර්ගයෙහි ගමන් කළ හෙයින් ද, සුන්දර වූ නිර්වාණයට සැපත් වූ හෙයින් ද, දෙලොවට ම වැඩ ඇති යහපත් වචන පවසන හෙයින් බුදුදුජාණන් වහන්සේ,

1. බුද්ධ නම් වන සේක.  2. සුගත නම් සේක.
3. විජ්ජාචරණ නම් සේක.  4. අරහං නම් සේක.

2 තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව ප්‍රගුණ කළ යුතු ගුණ ධර්ම විශේෂය හැඳින්වෙන්නේ,

1. පාරමිතා නමිනි  2. රාජ ධර්ම නමිනි  3. පුණ්‍ය ක්‍රියා නමිනි  4. සංයෝජන ධර්ම නමිනි

3 ශීලයෙන් යුතු ව සමාධි භාවනාව සඳහා යොමුවීමේ දී ඇති කරගත යුතු ගුණාංගයක් **නොවන්නේ,**

1. වීර්යය  2. සති සම්පජඤ්ඤ
3. සන්තුට්ඨිතා  4. ඉන්ද්‍රිය සංවරය

4 සතර මහා භූතයන්ට අයත් ආපෝ යන්නෙන් අදහස් කෙරෙනුයේ,

1. තද ගතියයි.  2. ද්‍රව ගතියයි.  3. සෙලවෙන ගතියයි.  4. උෂ්ණ ශීතල ගතියයි.

5 රාගාදී කෙලෙස් මල නිසා දූෂිත ව සිටින මිනිසුන් අතර විරාගිකව හා කෙලෙස් මලින් තොරව කටයුතු කිරීම,

1. සහජීවනය ලෙස හැඳින්වේ.  2. සමානාත්මතාව ලෙස හැඳින්වේ.
3. තාදී ගුණය ලෙස හැඳින්වේ.  4. පද්මාකාර ජීවිතය ලෙස හැඳින්වේ.

6 දහම තුළ''සඤ්ඤාව'' උපමාකර ඇත්තේ,

1. දිය බුබුළකට ය.  2. කෙසෙල් කඳකට ය.
3. මිරිඟුවකට ය.  4. මායාවකට ය.

7 පඤ්චානන්තරිය පාපකර්ම හා නියත මිත්‍යාදෘෂ්ටිය ආදී වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි වඩාත් බල සම්පන්න අකුසල කර්ම හැඳින්වෙන්යේ,

1. ගරුක කර්ම නම් වේ.  2. ආසන්න කර්ම නම් වේ.
3. ආචිණ්ණ කර්ම නම් වේ.  4. කටත්තා කර්ම නම් වේ.

8 ජනක කර්මයේ විපාක දීමේ හැකියාව නැති කොට තමා ම විපාක ලබා දෙන කර්මය,

1. උපඝාතක කර්ම යයි.  2. උපත්ථම්භක කර්ම යයි.
3. උපපීඩක කර්ම යයි.  4. ජනක කර්ම යයි.

9 "මහණෙනි ඒ මම කුසලය නම් කුමක් ද යි සොයන සුලු වූයෙමි. මගධ දනව්වෙහි පිළිවෙළින් සැරිසරන්නෙමි, උරුවේලයෙහි සේනානි ගම වෙතැ පැමිණියෙමි........'' මෙම ප්‍රකාශය සඳහන් සූත්‍ර දේශනාව නම්,

1. කරණීයමෙත්ත සූත්‍රයයි.  2. වනරෝපම සූත්‍රයයි.
3. මහා පරිනිබ්බාණ සූත්‍රයයි.  4. අරියපරියේසන සූත්‍රයයි.

10 සත් සතිය ගතකළ බුදුරජාණන් වහන්සේ අනිමිසලෝචන පූජාව සිදුකරනු ලැබුයේ,

1. පළමු සතියේ දී ය. 2. දෙවන සතියේ දී ය.
3. සිව්වන සතියේ දී ය. 4. හයවන සතියේ දී ය.

11 වැලිවිට අසරණ සරණ සිරි සරණංකර හිමියන්ගේ ආගමික හා සමාජයීය සේවා ලැයිස්තුවට ඇතුලත් **නොවන්නේ** මෙයින් කුමක් ද?
1. 'ධර්ම විනිශ්චය' ග්‍රන්ථය රචනා කිරීම.
2. අනුරාධපුර, දඹුල්ල, ආදී බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.
3. උඩුනුවර නියම කන්දේ පිරිවෙනක් පිහිටුවීම.
4. මහනුවර දේවාල පෙරහැරට දළදා මාළිගාවේ පෙරහැර එක් කිරීම

12 බුදු රජාණන් වහන්සේ අචිරවතී නදී තීරයෙහි පිහිටි අඹ වනයෙහි දී දේශනා කරන ලද සූත්‍රය කුමක් ද?
1. සිංසපා සූත්‍රය. 2. තේවිජ්ජ සූත්‍රය.
3. අම්බට්ඨ සූත්‍රය. 4. වේදනා පරිග්‍රහ සූත්‍රය.

13 බුදුරජාණන් වහන්සේ හයවන වස් කාලය ගත කළේ,

1. බරණැස ඉසිපතන මිගදායේ ය. 2. විශාලා මහනුවර කූටාගාර ලෙනෙහි ය.
3. භේෂකලා පර්වතයෙහි ය. 4. මකුල පර්වතයෙහි ය.

14 බුදුරජාණන් වහන්සේ සමග එකට සිටිමින් උන් වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළේ,

1. ද්‍රෝණ බමුණා ය. 2. සෝණදණ්ඩ බමුණා ය.
3. චංකි බමුණා ය. 4. බ්‍රහ්මායු බමුණා ය.

15 අනේපිඬු සිටුතුමා හා විශාඛා මහෝපාසිකාව පූජා කරන ලද විහාරයන් පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

1. ජේතවනාරාමය හා නිග්‍රෝධාරාමය 2. ජේතවනාරාමය හා පූර්වාරාමය
3. පූර්වාරාමය හා වාලුකාරාමය 4. වාලුකාරාමය හා නිග්‍රෝධාරාමය

16 "අනුන් මට දොස් කියතොත් එයට ඔබ කෝප නොවිය යුතු ය; අසතුටු නොවිය යුතු ය; එසේ ම මහණෙනි, අනුන් මගේ හෝ ධර්මයේ හෝ සංඝයාගේ හෝ ගුණ කියතොත් එයින් ද ඔබ බලවත් ප්‍රීතියට නොපැමිණිය යුතු ය; සොම්නස් ව ප්‍රීතියෙන් මුසපත් නොවිය යුතු ය." බුදුරදුන් මෙසේ වදාළේ,

1. සච්චක හා සුප්පිය මුල් කරගෙන ය. 2. උපතිස්ස හා කෝලිත මුල් කරගෙන ය.
3. සුප්පිය හා බ්‍රහ්මදත්ත මුල් කරගෙන ය. 4. උපාලි හා ජීවක මුල් කරගෙන ය.

17 'ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් ජය ගත යුතු ය. අයහපත කරන්නා යහපත කිරීමෙන් ජය ගත යුතු ය.' යන අර්ථය ලබා දෙන ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,

1. **අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං** යන්නයි.
2. **අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ** යන්නයි.
3. **සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච** යන්නයි.
4. **අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ** යන්නයි.

18 'නැවත සසරට එකතු වීම නිසා සසර ඉපදීම සිදු වේ.' යන අනුලෝම පටිච්චසමුප්පාද විවරනය දැක්වෙනුයේ,

1. ''භව පච්චයා ජාති''යනුවෙනි
2. ''නාම රූප පච්චයා සළායතනං යනුවෙනි''
3. ''සළායතන පච්චයා ඵස්සෝ යනුවෙනි''
4. ''විඤ්ඤාණ පච්චයා නාම රූපං යනුවෙනි ''

19 ධම්ම පදයේ සඳහන් ආකාරයට දුර්වල ගසක් සුළඟින් ඇද වැටෙන්නාසේ මරු වසඟයට පත්වනුයේ,

1. භෝජනයෙහි පමණ නොදන්නා තැනත්තාය. 2. නින්දෙහි පමණ නොදන්නා තැනත්තාය.
3. මත්ද්‍රව්‍ය වලට යොමු වූ තැනත්තාය. 4. අලසකමින් දිවිගෙවන තැනත්තාය.

20 බුදුරජාණන් වහන්සේට අසදෘශ මහා දානය පූජා කරන ලද්දේ,
1. කොසොල් රජතුමා ය. 2. බිම්බිසාර රජතුමා ය.
3. උදේන රජතුමා ය. 4. අජාසත්ත රජතුමා ය.

21 මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් මත දෙවනපෑතිස් නිරිඳුන් විසින් බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුන් වහන්සේ තැන්පත් කොට කරවන ලද දාගැබ වනුයේ,

1. කැළණි චෛත්‍යයයි. 2. ගිරිහඬු සෑයයි. 3. ථූපාරාම ස්තූපයයි. 4. මහියංගන ස්තූපයයි.

22 දුටුගැමුණු රජතුමන් විසින් සම්බුදු සසුන වෙනුවෙන් සිදුකරන ලද සේවා ලැයිස්තුවට ඇතුලත් නොවනුයේ,
1 වෙසක් උත්සව විසි හතරක් පැවැත්වීම
2 සෑම ගමකම දේශකයන් වහන්සේ ලවා පිරිත් දේශනා පැවැත්වීම
3 ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල් සේවාවක් ආරම්භ කිරිම
4 බෞද්ධ ලෝකයේ මුදුන් මල්කඩ ලෙස සැලකෙන මහාසෑය ගොඩ නැංවීම

23 සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතු වන කරුණක් **නොවන්නේ,**

1. මදයට හා ප්‍රමාදයට හේතු වන මද්‍යසාර ගැනීම
2. සුදුසු වේලාවන්හි මංමාවත්වල සැරිසැරීම
3. නැටුම් ගැයුම් වැයුම් හි ලොල් බව
4. සූදුවෙහි යෙදීම

24 ''ස්වාමීන් වහන්ස, බොහෝ මහණ බමුණෝ කේසපුත්තයට එති. ඔවුහු තම තමන්ගේ ආගමික මතය ම පවසති; එයට ම ප්‍රශංසා කරති; අනුන්ගේ මතයට ගරහති......'' මෙම ප්‍රකාශය සඳහන් වන්නේ,

1. වසල සූත්‍රයේ ය. 2. මංගල සූත්‍රයේ ය. 3. කාලාම සූත්‍රයේ ය. 4. පරාභව සූත්‍රයේ ය.

25 රජ පවුලේ පිරිසට, බළ සෙනඟට, ක්ෂත්‍රීය පිරිසට, බ්‍රාහ්මණ ගෘහපතීන්ට, කුඩා ගම්වල වැසියනට හා ජනපද වාසීන්ට, ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස්වලට, තිරිසනුන්ට හා පක්ෂීන්ට ධාර්මික රැකවරණය සලසන්න. යනුවෙන් සඳහන් වන්නේ,

1. සප්ත අපරිහානීය ධර්මවල ය. 2. දස රාජ ධර්මවල ය.
3. දස සක්විතිවත්වල ය. 4. සතර සංග්‍රහ වස්තුවල ය.

26 ආරියපාල තමාගේ ජාතිය, ධනය, ගෝත්‍රය පිළිබඳ මානයෙන් උදම් වී තමාගේ ඥාති මිත්‍රාදීන් පහත්කොට සිතමින් කටයුතු කරන ලදී. මෙසේ කටයුතු කළ ඔහු ටික කලකින් ම පරිහානියට පත්විය. මෙම සිදුවීම පැහැදිලි කරන සූත්‍ර දේශනාව වන්නේ.

1. මංගල සූත්‍රයයි. 2. පරාභව සූත්‍රයයි.
3. කාලාම සූත්‍රයයි. 4. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.

27 අලුවිහාර සංගීතිය හෙවත් සිව්වන ථේරවාද සංගීතියේ ප්‍රතිඵලයක් වන්නේ,

1. නිකාය භේදය ඇති වීම. 2. දේශාන්තර ව ධර්මය ප්‍රචාරය වීම.
3. ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම ය. 4. ත්‍රිපිටකය සම්පූර්ණ වීම.

28 තෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව මොග්ගලීපුත්ත තිස්ස හිමියන් විසින් අභිධර්ම පිටකයට අතුලත්කල ප්‍රකරණ ග්‍රන්ථය වනුයේ

1. විභංගප්පකරණයයි 2. ධාතුකථාප්පකරණයයි
3. පට්ඨානප්පකරණයයි 4. කථාවත්ථුපකරණයයි

29 ප්‍රථම ධර්ම සංගායනාව පවත්වන ලද්දේ,

1. විශාලා මහනුවර වාලුකාරාමයේ දී ය. 2. පැළලුප් නුවර අශෝකාරාමයේ දී ය.
3. රජගහනුවර සප්තපර්ණි ගුහා අභියස දී ය. 4. මාතලේ අලුවිහාරයේ දී ය.

30 "ස්වාමීනී අපි පස්කම් සුව අනුභව කරමින් අඹු දරුවන් නිසා වන කරදර සහිත ව ගිහි ගෙදර වාසය කරමු; කසී රට සුවඳ සඳුන් පරිභෝග කරමු; ........ '' මෙලෙස ප්‍රකාශ කළේ,

1. සුභ මානවකයා ය. 2. දීඝජාණු කෝලිය පුත්‍රයා ය.
3. කාලාම වැසියන් ය. 4. අනේපිඬු සිටුතුමා ය.

31 ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව හිතසුව පිණිස හේතුවන කරුණු අතරට අයත් **නොවන්නේ,**

1. උට්ඨාන සම්පදාවයි. 2. ආරක්ඛ සම්පදාවයි.
3. සීල සම්පදාවයි. 4. කල්‍යාණ මිත්තතාවයි.

32 ගිහියාගේ නිත්‍ය සීලය හෙවත් ගේහසිත සීලය,

1. පංච සීලය නම් වේ. 2. උපෝසථ අෂ්ටාංග සීලය නම් වේ.
3. ආජීවක අෂ්ටමක සීලය නම් වේ. 4. දස සීලය නම් වේ.

33 චූල්ලකම්ම විභංග සූත්‍රයෙහි සඳහන් ''අන් සැපතට ඊර්ෂ්‍යා නොකරන්නා''

1. මහේශාක්‍ය ව උපදී. 2. වර්ණවත් ව උපදී. 3. ආබාධ රහිත ව උපදී. 4. දීර්ඝායුෂ විඳී.

34 ''දුර ගමන් කරන, තනි ව හැසිරෙන, ශරීරයක් නැති, ගුහාවක වෙසෙන ...''යන ගාථාවේ මුල් දෙපදය වන්නේ,

1. ''සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ'' යන්නයි.
2. ''යාදිසං වපතේ බීජං - තාදිසං හරතේ ඵලං'' යන්නයි.
3. "දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං'' යන්නයි.
4. යෝ ච වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ යන්නයි.

35 සිතෙහි පවතින නොසන්සුන් බව, විසිරුණු ගතිය, සෙලවෙන ගතිය හා කළ - නොකළ වරද පිළිබඳ ව තැවෙන ස්වභාවය,

1. කාමච්ඡන්ද නම් වේ. 2. ව්‍යාපාද නම් වේ.
3. ථීනමිද්ධ නම් වේ. 4. උද්ධච්ච කුක්කුච්ච නම් වේ.

36 උදය බමුණාගේ ආරාධනයෙන් බුදුරදුන් ඇතුළු ශ්‍රාවක පිරිස දොළොස්වන වස්කාලය ගත කරණු ලැබුවේ කුමන ස්ථානයේ ද?

1. වේරංජා නුවරය. 2. රජගහ නුවරය.
3. සැවැත් නුවරය. 4. උදේනි නුවරය.

37 "ඇත ධූලින් වැසී ගිය ඇත්රජ යැ, මැත සවණක් සණ බුදුරැසින් සැදී ගිය බුදුරජාණෝ යැ, ඇත කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ,.... යන ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය,

1. බුත්සරණ නම් වේ. 2. අමාවතුර නම් වේ.
3. දහම්සරණ නම් වේ. 3. බුදුගුණාලංකාරය නම් වේ.

38 මුවදෙව්දාවත හා සසදාවත යන ග්‍රන්ථ දෙක රචනා කිරීම සඳහා පාදක වී ඇති ජාතක කතා දෙක වනුයේ,

1. සස ජාතකය හා සිවි ජාතකයයි.
2. මඛාදේව ජාතකය හා වෙස්සන්තර ජාතකයයි.
3. මඛාදේව ජාතකය හා සස ජාතකය යි.
4. වෙස්සන්තර ජාතකය හා සිවි ජාතකයයි.

39 සේදවත්තේ වෙහෙරගොඩැල්ල විහාරයේ චිත්‍ර අඳින ලද්දේ,

1. සෝලියස් මැන්දිස් මහතා ය. 2. එම්. සාර්ලිස් මහතා ය.
3. ජෝර්ජ් කීට් මහතා ය. 4. ඇල්බට් ධර්මසිරි මහතා ය.

40 ගන්ධ කුටි ආකෘතියට නිර්මාණය කළ ප්‍රතිමා ගෘහයක් දැකිය හැකි ස්ථානයකි

1. තොළුවිල පිළිමගෙය 2. රත්න ප්‍රාසාද ගොඩනැගිල්ල

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**බුද්ධ ධර්මය ii කොටස කාලය - පැය දෙකයි.**

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව, **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරු සඳහා පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

1. i. සිව්පසය නම්කරන්න.

ii. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතුකම් දෙකක් ලියන්න.

iii. ''දානංච ධම්මචරියා ච ඤාතකානඤ්ච සංගහෝ'' යන සූත්‍ර පාඨයේ ඇතුලත් මංගල කරුණු දෙකක් ලියන්න.

iv. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.

v. ''සමවායෝ ඒව සාධූ'' මෙම පාලි පාඨයෙහි අර්ථය ලියන්න.

vi. බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

vii. පුරාවිද්‍යාත්මක සාධක අනුව තහවුරු කළ කලාත්මක බෝධිඝරය හා කලාත්මක මුරගල පිහිටා ඇත්තේ කුමන ස්ථානයන්හි ද? .

viii. තුන්තරා බෝධියට අයත් බෝධීන් දෙකක් නම් කරන්න.

ix. පුද්ගල චරිත හයෙන් දෙකක් නම් කරන්න.

x. ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇති කරගත හැකි අවබෝධය දෙයාකාර ය. එම ආකාර දෙක ලියා දක්වන්න.

2. i. දස පාරමිතාවලින් දෙකක් නම් කරන්න.

ii. ඉහත නම් කළ එක් පාරමිතාවක් හඳුන්වන්න.

iii. දැහැමි සමාජයක් බිහි කිරීමට පාරමිතා ධර්ම ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

3. i. **තංච කම්ම කතං සාධූ .....** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii. එම ගාථාවේ තේරුම ලියන්න.

iii. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදයෙන් ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

4. i. අණන සූත්‍රයෙහි සඳහන් චතුර්විධ සැප අතරින් දෙකක් නම් කරන්න.

ii. එයින් එක් කරුණක් හඳුන්වන්න.

iii. බුදු දහමේ උගන්වා ඇති චතුර්විධ සුඛය පුද්ගලයාගේ ලෞකික දියුණුවට හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

5. i. බුද්ධ ප්‍රතිමාවල දැකිය හැකි මුද්‍රා දෙකක් නම් කරන්න.

ii. ඉන් එකක් කෙටියෙන් හඳුන්වා දෙන්න.

iii. ශ්‍රී ලාංකේය කලා කරුවාගේ කලා කෞශල්‍ය බුද්ධ ප්‍රතිමා තුළින් ප්‍රකට වන අයුරු පැහැදිලි කරන්න.

6. i. දෙවන ධර්ම සංගීතියට බලපෑ හේතුව පෙන්වා දෙන්න.
ii. දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වයගත් මහරහතන් වහන්සේ, අනුග්‍රාහකත්වය දැක් වූ රජතුමා පිළිවෙලින් දක්වන්න.
iii. බුදු සසුනේ උන්නතියට දෙවන ධර්ම සංගායනාව ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

i. රේරුකානේ චන්දවිමල හිමි

ii. උට්ඨාන සම්පදා

iii. සඳකඩපහණ

iv. ත්‍රිලක්‍ෂණය

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**අ.පො.ස. සා/පෙළ 2022 - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 බුද්ධ ධර්මය**

**1 පත්‍රය** **පැය 01 යි**

ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01.බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ දෙවියෙක් , ගාන්ධර්වයෙක් , යක්ෂයෙක් හෝ මනුෂ්‍යයෙක් නොවන බවත් බුද්ධ බවත් දේශනා කරනු ලැබුයේ,

1.ද්‍රෝණ බමුණාට ය 2. සේල බමුණාට ය

3. සොත්ථිය බමුණාට ය 4. භාරද්වාජ බමුණාට ය

02. බුදුරජාණන් වහන්සේ පළමු වස් කාලය ගත කළේ ,

1. විශාලා මහ නුවර කූටාගාර ශාලාවේ ය. 2. අජපාල නුගරුක මුල ය.

3. බරණැස ඉසිපතනෙහි ය. 4. පාරිලෙය්‍ය වනයෙහි ය.

03. බුද්ධ , ධම්ම , සංඝ යන රතනත්‍රයෙහි සුවිසි ගුණ ශිෂය ජීවිතයක සාර්ථකත්වයට උපයෝගී කර ගත හැක්කේ එම ගුණ

1. ඉගෙනීමෙනි. 2. චරිතායනය කිරීමෙනි.

3. සජ්ඣායනා කිරීමෙනි. 4. අන් අයට කියා දීමෙනි.

04. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමෝ , තණ්හාවෙන් , මානයෙන් , මිත්‍යාදෘෂ්ටියෙන් මිදි කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව ප්‍රගුණ කරන පිළිවෙත් සමූහය ,

1. දස කුසල නම් වේ 2. දස සිල් නම් වේ.

3. දස පුණ්‍ය ක්‍රියා නම් වේ 4. දස පාරමිතා නම් වේ.

05. බෝසතාණන් වහන්සේ දාන උප පාරමිතාව සම්පූර්ණ කළ බව හෙළි වන ජාතක කථාව,

1. වණ්ණුපථ ජාතකය යි. 2. සස ජාතකය යි.

3. සිවි ජාතකය යි. 4. උම්මග්ග ජාතකය යි.

06. මට්ටකුණ්ඩලි , රජ්ජුමාලා වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුරජුන් තුළ පැවති ,

1. අසරණ සරණ ගුණය යි. 2. සහනශීලී ගුණය යි.

3. ගිලානොපස්ථානය යි. 4. අකම්පස ගුණය යි.

07. නිවන් පසක් කර ගැනීමට අවශ්‍ය වන මනා පිළිවෙත් රකින බැවින් මහා සඟරුවන ,

1. උජුපටිපන්න නම් වේ. 2. සුපටිපන්න නම් වේ.

3. ඤායපටිපන්න නම් වේ. 4. සාමීචිපටිපන්න නම් වේ.

08. සිදුහත් බෝසතාණන් වහන්සේට “ වේරංජාවේ දි ” <u>යව</u> නැමැති කටුක ආහාරය වළඳමින් කල් ගෙවීමට සිදු වූයේ ,

1. දෙවන වස් කාලයේ දී ය. 2. දසවන වස් කාලයේ දී ය.

3. සත්වන වස් කාලයේ දී ය. 4. දොළොස් වන වස් කාලයේ දී ය.

09. සතර සංග්‍රහ වස්තුවට අයත් නොවන කරුණ වන්නේ ,

1. සීලය යි 2. දානය යි 3. ප්‍රියවචනය යි. 4. සමානාත්මතාවය යි

10. උපතිස්ස පිරිවැජියා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලෙස , “ යෙ ධම්මා හේතුප්පභවා ..........” යනාදි ගථාව ප්‍රකාශ කළේ

1. වප්ප හිමි ය 2. අස්සජි හිමි ය

3. මහානාම හිමි ය . 4. භද්දිය හිමි ය

11. “තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. වැඩදායක දේ සිදු කිරීම අපහසු ය. ” යන අදහස ඇතුළත් ධම්ම පද ගාථාවේ මුල් දෙපදය වනුයේ,

1. යෝචේ වස්සතං ජීවේ -දුස්සීලෝ අසමාහිතෝ
2. නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
3. සුකරානි අසාධූනි - අත්තනො අහිනාහි ච.
4. අත්තනාව කතං පාපං -අත්තනා සංකිලිස්සති

12. යම් සේ ගසක මුල ශක්තිමක්ව නොගැළ වී පවතින්නේ ද ඒතාක් කල් එම ගස නැවත නැවත ලියලන්නා සේ පුද්ගලයා ද ,නැවත නැවත සසර දුකට පත්වන්නේ,

1. වෛරය හේතු කර ගෙන ය.
2. ථීන මිද්ධය හේතු කර ගෙන ය.
3. මානය හේතු කරගෙන ය.
4. තණ්හාව හේතු කරගෙන ය.

13. මරණින් පසු පළමු ආත්මභාවයේ දී හෙවත් ඊළඟ භවයේ දී විපාක දෙන කර්ම,

1. දිට්ඨධම්මවේදනීය කර්මය නම් වේ.
2. උප්පජ්ජවේදනීය කර්මය නම් වේ
3. අපරාපරියවේදනීය කර්මය නම් වේ
4. අහෝසිකර්ම නම් වේ.

14. පංචානන්තරිය පාපකර්ම හා නියත මිත්‍යා දෘෂ්ටිය ආදි වඩාත් බරපතල කර්ම හඳුන්වනුයේ ,

1. ගරුක අකුසල කර්ම නමිනි.
2. ආසන්න අකුසල කර්ම නමිනි.
3. ආචින්න අකුසල කර්ම නමිනි.
4. කටත්තා අකුසල කර්ම නමිනි.

15. බුදුරාජාණන් වහන්සේ විසින් රෝග වැළඳීමට හේතු අටක් දක්වමින් දේශනා කළ සූත්‍රය වන්නේ,

1. රතන සූත්‍රය යි
2. කරණීය මෙත්ත සූත්‍රය යි
3. ගිරිමානන්ද සූත්‍රය යි
4. වේදනා පරිග්ගහ සූත්‍රය යි

16. “නැවත සසරට එකතු වීම නිසා සසර ඉපදීම සිදු වේ ” යන අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,

1. භව පච්චයා ජාති යන්න යි
2. නාම රූප පච්චයා සළායතණ යන්න යි
3. සළායතණ පච්චයා ඵස්සෝ යන්න යි
4. විඤ්ඤාණ පච්චයා නාම රූප යන්න යි.

17. ආහාරයෙහි පමණ දැන අනුභව කිරීම නිසා යහපත් ප්‍රතිඵල ලැබෙන බව “ භද්දාලි සූත්‍රයෙහි ” දැක් වේ ..එහි සඳහන් යහපත් ප්‍රතිඵලයක් නොවන්නේ පහත කවරක් ද ?

1. රෝගාබාධ අඩු වීම
2. බුද්ධිමත් බව වැඩි වීම
3. නිදුක් බව ලැබීම
4. කාය බලය ලැබීම

18. දැහැමි ව උපයා සපයා ගත් ධනය ගිනි,සතුරු ආදීන්ගෙන් විනාශ වීමට ඉඩ නොදී මනාව සුරක්ෂිත කර ගැනීම හඳුන්වන්නේ,

1. උට්ඨාන සම්පදා නමිනි.
2. සමජීවිකතා නමිනි.
3. කල්‍යාණ මිත්තතා නමිනි.
4. ආරක්ඛ සම්පදා නමිනි.

19. බුදුරජාණන්වහන්සේ විසින් සුදුසු ප්‍රදේශයක වාසය කිරීම,පෙර පින් ඇති බව,මැනවින් හික්මීම ආදි පුද්ගල දියුණුවට ඉවහල් වන කරුණු ඇතුළත් කරමින් දේශනා කළ සූත්‍රය වන්නේ,

1. පරාභව සූත්‍රය යි
2. ආරිය පරියේසන සූත්‍රය යි
3. මංගල සූත්‍රය යි
4. කාලාම සූත්‍රය යි

20. නිවන් මග ආවරණය කරන පංච නීවරණ ධර්ම අතර “ ව්‍යාපාදය උපමා කොට ඇත්තේ,

1. රත් වී උතුරන විට බුබුළු නැගෙන ජලයකට ය.
2. කැලඹී ගිය ජලයකට ය.
3. පාසි සහිත ජලයකට ය.
4. බොර වී ගිය ජලයකට ය.

21. භාවනාවට යොමු වන පුද්ගලයා විසින් හිඳීම ,සිටීම , ඇවිදීම ආදි ඉරියව් පැවැත්වීම අවබෝධයෙන් සිදු කළ යුතුය.එය ධර්මයේ හැඳින්වෙන්නේ ,

1. ඉන්ද්‍රිය සංවරය නමිනි.
2. කායානු පස්සනා නමිනි.
3. වේදනානුපස්සනා නමිනි.
4. සතිසම්පජඤ්ඤය නමිනි.

22. පංචස්කන්ධය හෙවත් නාම රූප හේතු කොට ගෙන ෂඩායතන (ආයතන 06) ඇති වන බව හේතු ඵල ධර්මයෙහි දැක්වේ . එම ආයතන 06 වන්නේ,

1. රූප ,වේදනා , සංඥා, සංකාර , විඥ්ඥාන,
2. රූප,ශබ්ද.ගන්ධ,රස,ස්පර්ශ, ධර්ම නම් වේ.
3. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස ඉන්ද්‍රිය නම් වේ.
4. චක්ඛු,සෝත, ඝාන,ජිව්හා,කාය, මන නම් වේ.

23. තිදොරින් සිදුවන දස අකුසල කර්ම අතර මනෝ කම්ම ගණයට අයත් <u>නොවන</u> කරුණක් වන්නේ, පහත කවරක් ද?

1. අදත්තාදානය
2. අභිද්‍යාව
3. ව්‍යාපාදය
4. මිත්‍යාදෘෂ්ටිය

24. බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය සූත්‍ර සුභ මානවකයාට දේශනා කළ පරිදි ද්වේශයෙන් තොර ව කටයුතු කරන තැනැත්තා,

1. දීර්ඝායුෂ ඇති ව උපදී
2. රූමත් ව උපදී
3. නිරෝගී ව උපදී
4. යසස් ඇති ව උපදී

25. තමාට හැකියාව තිබිය දී ත් මහලු වියට පත් මව්පියන්ට නො සැලකීමේ ආදීනව දැක්වෙන සූත්‍ර දේශනාව,

1. මංගල සූත්‍රයයි
2. පත්තකම්ම සූත්‍රයයි
3. පරාභව සූත්‍රයයි
4. සිඟාලෝවාද සූත්‍රයයි

26. බෞද්ධ පංචබලි සංකල්පයේ එන"පුබ්බපේත බලි" යන්නෙහි අර්ථය වන්නේ,උපයාගත් ධනයෙන්

1. ඥාතීන්ට සංග්‍රහ කිරීම යි.
2. ආගන්තුකයන්ට සංග්‍රහ කිරීම යි.
3. මිය ගිය ඥාතීන්ට පිං දීම යි.
4. රජයට ගෙවිය යුතු බදු ගෙවීම යි.

27. "දූරංගමං ඒක චරං - අසරීරං ගුහාසයං" යන ධම්මපද ගාථාවෙන් දැක්වෙන්නේ,

1. කයෙහි ස්වභාව ය යි.
2. සිතෙහි ස්වභාව ය යි.
3. සංස්කාර ධර්මවල ස්වභාවය යි.
4. රූපධර්මවල ස්වභාව ය යි.

28. පළමු හා දෙවන සංගායනාවල මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,

1. මොග්ගලී පුත්තතිස්ස හිමි සහ මහා දේව හිමි ය.
2. මහා කාශ්‍යප හිමි සහ සබ්බකාමි හිමි ය.
3. ආනන්ද හිමි සහ යස හිමි ය.
4. අනුරුද්ධ හිමි සහ රේවත හිමි ය.

29. අශෝක මහ රජතුමාගේ දූරදර්ශී වැඩපිළිවෙළ යටතේ දායකත්වය දරමින් පවත්වන්නට යෙදුණ ධර්ම සංගායනාව වනුයේ,

1. තෙවන ධර්ම සංගායනාව යි.
2. සිව්වන ධර්ම සංගායනාව යි.
3. කණිෂ්ක ධර්ම සංගායනාව යි.
4. අලුවිහාර සංගායනාව යි.

30. දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිගහැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන මුද්‍රාව හඳුන්වන නම කුමක් ද?

1. ධ්‍යාන මුද්‍රාව
2. විතර්ක මුද්‍රාව
3. අභය මුද්‍රාව
4. ධර්මචක්‍ර මුද්‍රාව

31. මහනුවර යුගය වන විට පරිහානියට පත්ව තිබූ සම්බුද්ධ සසුන නැවත නගා සිටුවීම සඳහා කටයුතු කළ යතිවරයාණන් වහන්සේ

1. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය
2. මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමිපාණෝ ය.
3. වාරියපොල ශ්‍රී සුමංගල හිමිපාණෝ ය.
4. වැලිවිට අසරණ සරණ සිරිසරණංකර සගරජ හිමිපාණෝ ය

32. " බුදුන් සරණ යෙමි යි බුත්සරණ යායුතු " යනුවෙන් සෑම ජේදයක් අවසානයේ දක්වමින් බුදුගුණ වර්ණනා කරමින් " අමෘතාවහ" නම් ග්‍රන්ථය රචනා කළ කතුවරයා,

1.ගුරුළුගෝමි පඬිතුමා ය.
2. .විද්‍යාචක්‍රවර්ති පඬිතුමා ය .
3. .බුද්ධ පුත්‍ර හිමි ය.
4. .ධර්මසේන හිමි ය

33. කෝට්ටේ යුගයේ විසූ වීදාගම මෛත්‍රී මාහිමියන් විසින් ලියූ සැදැහැ ගුණ වඩන අගනා කාව්‍ය ග්‍රන්ථය,

1.ලෝ වැඩ සඟරාව යි
2. .යසෝදරාවත යි
3. .කාව්‍ය ශේඛරය යි
4. .බුදුගුණාලංකාරය යි

34. බුද්ධ ප්‍රතිමා නිර්මාණය හා වන්දනය ජනප්‍රියවීමත් සමඟ ප්‍රතිමාවල ආරක්ෂාව සඳහා ගෘහයක් ඉදි වූ අතර එය

1.පටිමාඝර නමින් හැඳින් වේ .
2. .චෛතියඝර නමින් හැඳින් වේ.
3. .පධානඝර නමින් හැඳින් වේ .
4. .බෝධිඝර නමින් හැඳින් වේ.

35. පාලකයෙකු යුක්තිය හා සාධාරණත්වය ඉටු නොවන ලෙස ස්ව කැමැත්ත මත අගතිගාමීව කටයුතු කිරීම

1.ද්වේශය ලෙස හැඳින් වේ
2. .භය ලෙස හැඳින් වේ
3. .ඡන්දය ලෙස හැඳින් වේ
4. .මෝහය ලෙස හැඳින් වේ

36. ස්තූපයක ගර්භයේ හැඩය නෙලුම්මලක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ ,

1.ධාන්‍යාකාර ස්තූප ලෙස යි
2. . පද්මාකාර ස්තූප ලෙස යි
3. ඝටාකාර ස්තූප ලෙස යි
4. . ඝණ්ඨාකාර ස්තූප ලෙස යි

37. මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලැබූ දායාද ගණයට අයත් නොවන කරුණ වන්නේ,

1.භික්ෂු සමාජය ආරම්භ වීම යි
2. . අක්ෂරමාලාවක් ලැබීම යි
3. ශ්‍රී මහා බෝධින් වහන්සේ ලැබීම යි
4. . ශ්‍රී දළදා වහන්සේ ලැබීම යි.

38. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා වූයේ ,

1.කුරුණෑගල යුගයේ දී ය
2. දඹදෙණි යුගයේ දී ය
3. පොළොන්නරු යුගයේ දී ය
4. යාපහුව යුගයේ දී ය

39. මහනුවර රාජධානි යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ටැම්පිට විහාරයක් වන්නේ,

1.හිඳගල විහාරය යි
2. ගල් විහාරය යි
3. මැදවල විහාරය යි
4. තිවංක පිළිම ගෙය යි

40. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමෙන් පසු ඉදි වූ ප්‍රථම ස්තූපය ලෙස සැලකෙන්නේ

1.ගිරිහඬු සෑය යි
2. ථූපාරාම දාගැබ යි
3. රන්කොත් වෙහෙර යි
4. මහා සෑය යි.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**අ.පො.ස. සා/පෙළ 2022 - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**11 බුද්ධ ධර්මය**

**11 පත්‍රය** **පැය 02 යි**

- ❖ පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව, **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.
- ❖ නිවැරදි පිළිතුරු සඳහා පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1. I. සිව්පසය නම්කරන්න.

   II. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතුකම් දෙකක් ලියන්න.

   III. ''දානංච ධම්මචරියා ච ඤාතකානඤ්ච සංගහෝ'' යන සූත්‍ර පාඨයේ ඇතුලත් මංගල කරුණු දෙකක් ලියන්න.

   IV. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.

   V. ''සමවායෝ ඒව සාධු'' මෙම පාලි පාඨයෙහි අර්ථය ලියන්න.

   VI. බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

   VII. පුරාවිද්‍යාත්මක සාධක අනුව තහවුරු කළ කලාත්මක බෝධිඝරය හා කලාත්මක මුරගල පිහිටා ඇත්තේ කුමන ස්ථානයන්හි ද? .

   VIII. තුන්තරා බෝධියට අයත් බෝධීන් දෙකක් නම් කරන්න.

   IX. පුද්ගල චරිත හයෙන් දෙකක් නම් කරන්න.

   X. ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇති කරගත හැකි අවබෝධය දෙයාකාර ය. එම ආකාර දෙක ලියා දක්වන්න.

2. I. දස පාරමිතාවලින් දෙකක් නම් කරන්න.

   II. ඉහත නම් කළ එක් පාරමිතාවක් හඳුන්වන්න.

   III. දැහැමි සමාජයක් බිහි කිරීමට පාරමිතා ධර්ම ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

3. I. **තංච කම්ම කතං සාධු .....** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

   II. එම ගාථාවේ තේරුම ලියන්න.

   III. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදයෙන් ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

4. I. අණන සූත්‍රයෙහි සඳහන් චතුර්විධ සැප අතරින් දෙකක් නම් කරන්න.

   II. එයින් එක් කරුණක් හඳුන්වන්න.

   III. බුදු දහමේ උගන්වා ඇති චතුර්විධ සුඛය පුද්ගලයාගේ ලෞකික දියුණුවට හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

5. I. බුද්ධ ප්‍රතිමාවල දැකිය හැකි මුද්‍රා දෙකක් නම් කරන්න.

   II. ඉන් එකක් කෙටියෙන් හඳුන්වා දෙන්න.

   III. ශ්‍රී ලාංකේය කලා කරුවාගේ කලා කෞශල්‍ය බුද්ධ ප්‍රතිමා තුළින් ප්‍රකට වන අයුරු පැහැදිලි කරන්න.

6. I. දෙවන ධර්ම සංගීතියට බලපෑ හේතුව පෙන්වා දෙන්න.

   II. දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වයගත් මහරහතන් වහන්සේ, අනුග්‍රාහකත්වය දැක් වූ රජතුමා පිළිවෙලින් දක්වන්න.

   III. බුදු සසුනේ උන්නතියට දෙවන ධර්ම සංගායනාව ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

   I. රේරුකානේ චන්ද්‍රවිමල හිමි

   II. උට්ඨාන සම්පදා

   III. සඳකඩපහණ

   IV. ත්‍රිලක්ෂණය